**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)
Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com
AIALIFE.COM.LK

# Media Release

## AIA ඉන්ෂුවරන්ස් අඛණ්ඩ 6 වන වසරටත් වයඹ විශ්ව විද්‍යාලය වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කරයි

අඛණ්ඩව හය වන වසරටත් AIA ඉන්ෂුවරන්ස්, වයඹ විශ්ව විද්‍යාලය සමග එක් වෙමින් රක්ෂණ හා තක්සේරුකරණ අංශයෙහි විශිෂ්ටතම ශිෂ්‍යයා වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට කටයුතු යෙදීය.  මෙම වසරේදී ශිෂ්‍යත්වය පිරිනැමුනේ වරුණි නිල්වලා සිසුවිය වෙත වන අතර ඇය හට මාසික දීමනාවක් සමගින් සමාගමෙහි උපාධි අපේක්ෂකයින් සඳහා වන හය මසක අභ්‍යාසලාභී පුහුණු වැඩසටහනකට සහභාගී වීමේ අවස්ථාව ද උදා වේ.  වරුණි පාසැලේදී මෙන්ම විශ්ව විද්‍යාලයේදී ද විශිෂ්ට අධ්‍යාපනික කුසලතාවන් සහ ක්‍රීඩා හා නායකත්ව කෞශල්‍යයන් ප්‍රදර්ශනය කොට ඇත.

මෙම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේ දී AIA ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන විධායක නිලධාරී ෂා රූෆ් මෙසේ සිය අදහස් දැක්වීය. ''මෙරට රක්ෂණ ක්ෂේත්‍රයෙහි අභිවෘද්ධිය උදෙසා ප්‍රථම වරට රක්ෂණ හා තක්සේරුකරණ උපාධි පාඨමාලාවක් හඳුන්වාදුන් වයඹ විශ්ව විද්‍යාලය සමග එක්ව රක්ෂණ අධ්‍යයනයේ විශිෂ්ට දක්ෂතා දක්වන සිසු සිසුවියන් වෙත ප්‍රතිලාභ සැලසීමට හැකිවීම පිළිබඳව AIA ඉන්ෂුවරන්ස් හි අප අතිශය සතුටට පත් වෙනවා. ''

**Media Enquiries: Suren Perera, Head of Marketing & Company Spokesman Office – 2310028, Mobile – 0773 457 959**